# 11. දෙව් මැදුරේ දී දෙව්දූ යදිමු

ඉරු දින පාසල අවසන් වූ විට ළමුන් දෙව් මැදුරට ගියා. සැම දෙනා ම දේව පියාට ගී ගැයුවා. දේව වචනය කියෙව්වේ අමර. එම කොටසේ කියැවුණු කතාව දේව ගැතිතුමා තව දුරටත් ලස්සනට පැහැදිලි කර දුන්නා. ළමුන් ආසාවෙන් එය අසා සිටියා. ඒ විතරක් නෙවෙයි, දේව පියාට කතා කරන්නත් දේව ගැතිතුමා ළමුන්ට මග පෙන්නුවා.

**දේව ගැතිතුමා**
දෙව්දූනි අපගේ
යැදුම් අසනු මැන.

**කමලා**
මුතු ඇටයක් වන්
අපගේ රට ගැන
දේව පියේ ඔබටයි තුති පැසසුම්

**අමර**
ලස්සන ලෝකය
අපට මවා දුන්
දේව පියා හට තුති වේවා!

**කුමාර්**
මල් වගේ ලස්සන
පුංචි ළමයි සැම
ආදරයෙන් රැක ගනු
මැන දෙව්දූනි.

**නයනා**
ලෙඩින් සිටින සැම දෙනාට
සුවය දෙන්න, සමිඳුනි.

**දේව ගැතිතුමා**
ආදරයෙන් අපට සවන්
දුන් සමිඳුට, මේ පැසසුම්.
ආමෙන්.

**පැවරුම්**

1. මෙම පාඩමේ සඳහන් වන එක් එක් ළමයා යාච්ඤා කළේ කුමන දේ ගැන ද?
2. අපතේ යන ද්‍රව්‍ය භාවිත කොට දෙව් මැදුරක් දැක්වෙන රූප සටහනක් සකසන්න.